**ඇමෙරිකා එක්සත් ජනපද තානාපති කාර්යාලය**

කොළඹ

# ප්‍රවෘත්ති නිවේදනය

මහජන කටයුතු අංශය


දුරකථනය: +94 (1) 249-8100 ෆැක්ස්: +94 (1) 244-9070

විද්‍යුත් තැපෑල: VanHornNT@state.gov http://lk.usembassy.gov


නිවේදන අංක: 01232019

## එක්සත් ජනපද නාවික හමුදාව
## තාවකාලික භාණ්ඩ හුවමාරු වැඩ සටහන පවත්වයි

ජනවාරි 23, කොළඹ: ජනවාරි 21 සිට 29 දක්වා එක්සත් ජනපද නාවික හමුදාව විසින් කොළඹින් පිටත පිහිටි බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපලේ ගුවන් යානා අතර ගුවන් භාණ්ඩ හුවමාරු කිරීම සඳහා වූ මෙහෙයුමක් සිදු කරනු ඇත. මෙය සැපයුම් හා වාණිජ කටයුතු සඳහා කලාපීය කේන්ද්‍රයක් බවට පත්වීමට ශ්‍රී ලංකාව ගන්නා උත්සාහයන් ප්‍රවර්ධනය කරන විශාල තාවකාලික භාණ්ඩ හුවමාරු වැඩසටහනකි. ජනවාරි මාසයේ සිදුකරන මෙහෙයුම් මගින් ශ්‍රී ලංකා රුපියල් මිලියන 25 ක පමණ දායකත්වයක්මෙරට ආර්ථිකය වෙත ලබා දෙනු ඇත. මෙය තාවකාලික භාණ්ඩ මාරු කිරීමේ වැඩ සටහනේ තුන්වැනි අවස්ථාව වේ. 2018 අගෝස්තු මාසයේදී බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපලේ හා ත්‍රිකුණාමලයේදීත් 2018 දෙසැම්බර් මස බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපලේදීත් පැවැත්වූ සාර්ථක භාණ්ඩ හුවමාරු වැඩ සටහන් ඉදිරියට පවත්වා ගෙන යාමකි.

ශ්‍රී ලංකාව ඉන්දු-පැසිෆික් කලාපයේ සුවිශේෂී ස්ථානයක පිහිටා ඇති අතර එම ස්ථානගත වීමෙන් ලබා ගත හැකි වාසි රටට ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ නායකයින් විසින් සිය රටේ කලාපීය සහයෝගිතාවය පිළිබඳ දැක්ම ඉදිරිපත් කර ඇති බව එක්සත් ජනපද තානාපතිනී ඇලිනා බී ටෙප්ලිට්ස් පැවසීය. "කාර්ය බහුල ඉන්දු-පැසිෆික් සාගර තීරුවේ ගමන් ගන්නා එක්සත් ජනපද මිලිටරි හා වාණිජ නෞකා වලට ශ්‍රී ලාංකීය සේවාවන් සහ භාණ්ඩ ලබා ගැනීම වැනි අන්‍යෝන්‍ය ප්‍රතිලාභ සහිත වැඩ සටහන් හරහා ශ්‍රී ලංකාවේ මෙම උත්සාහය සඳහා සහයෝගය දැක්වීමට ලැබීම පිළිබඳ අපි සතුටු වෙමු."

මෙම ව්‍යාපෘතිය යටතේ ආයුධ නොවන භාණ්ඩ රැගත් එක්සත් ජනපද නාවික ගුවන් යානා කිහිපයක් ගුවන් තොටුපොළට ගොඩ බැසීමට හා වාණිජ ගුවන් තොටුපළෙන් පිටත් වීමට සැලසුම් කර ඇත. භාණ්ඩ හුවමාරු කර ගන්නා ගුවන් යානා පසුව මුහුදේ නවතා ඇති යූ.එස්.එස්. ජෝන් සී ස්ටෙනිස් නෞකාවට ගොඩ බස්වනවා ඇත. මෙම සැපයුම්වලට නාවිකයන්ට ලැබුණු පුද්ගලික ලිපි, කඩදාසි භාණ්ඩ, අමතර කොටස් සහ මෙවලම් සහ වෙනත් භාණ්ඩ ඇතුළත් විය හැකිය. නැව් භාණ්ඩ, යුධ උපකරණ හෝ මෙමමෙහෙයුමට සහභාගී වන කිසිවෙකු මෙහෙයුමෙන් පසුව ශ්‍රී ලංකාව තුළ රැඳී නොසිටිනු ඇත.

එක්සත් ජනපද ශ්‍රී ලංකා ආරක්ෂක සහයෝගිතාව, විවිධ ඒකාබද්ධ අභ්‍යාස සහ පුහුණු වැඩ සටහන් වලින් සමන්විත වන අතර එය දෙරටේම හැකියාවන් සහ සාමූහික මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම සඳහා වන හැකියාව වර්ධනය කරනු ඇත. දෙරට විසින් මෙම සහයෝගිතාවය සැලසුම් කරනු ලැබුයේ මානුෂීය ආධාර සහ ආපදා සහන සැපයීම සහ නාවික කටයුතු පිළිබඳ දැනුම හුවමාරු කර ගැනීම වැනි අපගේ අන්‍යෝන්‍ය ආරක්ෂක අවශ්‍යතා සපුරා ගැනීම සඳහායි.